දුරකථන/தொலைபேசி இல./Telephone Nos.

අමාත්‍යතුමා / அமைச்சர் / Minister } 2784832

ලේකම් / செயலாளர் / Secretary } 2784811

කාර්යාලය / அலுவலகம் / Office } 2785141-50
Fax: 2784846

ඊමේල්/ஈ-மெயில்/E-mail : isurupaya@moe.gov.lk

ඔබේ අංකය / உமது இல. / Your No. } ..............................

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ
බත්තරමුල්ල
இசுருபாய, ஸ்ரீ ஜயவர்த்தனபுர கோட்டை
பத்தரமுல்ல
"Isurupaya", Sri Jayawardhanapura Kotte
Battaramulla.

මගේ අංකය / எமது இல. / My No. } ED/01/26/07/01/01

දිනය / திகதி / Date } 2010-06-28


චක්‍රලේඛ අංක **2010 / 23**

සියලු ම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,

සියලු ම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,

සියලු ම විදුහල්පතිවරුන්,

**<u>පාසල් පරිගණක විද්‍යාගාරයන්හි පවතින පරිගණක උපාංග සහ පරිගණක ජාල නඩත්තුව සම්බන්ධයෙන් වූ ජාතික මට්ටමේ පරිගණක උපාංග හා ජාල නඩත්තු වැඩසටහන.</u>**

අධ්‍යාපන අමාත්‍යාංශයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ශාඛාව විසින් වගකීම් කාලය අවසන් වූ පරිගණක හා පරිගණක උපාංගවල නඩත්තු කටයුතු සහ එම විෂයය සම්බන්ධයෙන් පාසල් මට්ටමේ සිසුන්ගේ දැනුම දියුණු කිරීම යන අරමුණු සහිතව සුදුසුකම් සහිත ගුරුභවතුන්ගෙන් සැදුම්ලත් ජාතික මට්ටමේ දෘඩාංග හා ජාලගත කණ්ඩායමක් ස්ථාපිත කර ඇත. අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් මෙම කණ්ඩායමේ ගුරුභවතුන් සඳහා විධිමත් පුහුණුවක් විශ්ව විද්‍යාල මඟින් ලබා දී ඇති අතර, තවදුරටත් එම කණ්ඩායම දැනුමින් සහ කුසලතාවලින් සන්නද්ධ කිරීමේ කටයුතුවල නියැලී සිටී.

මෙම සුදුසුකම් සහිත කණ්ඩායම යොදා ගනිමින් ඒ ඒ පළාත් විසින් දිස්ත්‍රික් මට්ටමින් වගකීම් කාලය අවසන් වූ පරිගණක, උපාංග සහ ජාල නඩත්තු කිරීමේ වැඩසටහනක් 2009 වසරේ දී ක්‍රියාත්මක කරන ලදි. එම වැඩසටහනේ සාර්ථකත්වය මත එය 2010 වසරේ සිට ඉදිරියට වාර්ෂික ව පවත්වනු ලබන ජාතික වැඩ පිළිවෙලක් බවට මේ සමඟ ක්‍රියාත්මක කිරීමට තීරණය කර ඇත.

මෙම වැඩසටහන මඟින් පරීක්ෂණයට භාජනය කරනු ලබන ඒ ඒ පරිගණක හා උපාංගවල තත්ත්වය පිළිබඳ සඳහන් තාක්ෂණ වාර්තාව, වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයේ දී තාක්ෂණ ඇගයීම් කමිටු වාර්තාව ලෙස භාවිත කළ යුතු බව ද දන්වමි. අදාළ වාර්තාවේ ආකෘතිය මේ සමඟ ඉදිරිපත් කර ඇති අතර මෙම ක්‍රියාවලිය පහත සඳහන් පරිදි සිදු කළ යුතු වේ.

__ක්‍රියාවලිය__

1. සෑම වසරකදීම 2 වන වාරය අවසානයේ දී එළඹෙන වාර අවසාන නිවාඩුව ඉලක්ක කර මෙම ජාතික මට්ටමේ නඩත්තු වැඩසටහන ක්‍රියාත්මක කළ යුතු වේ.
2. ඒ ඒ පළාත්වල තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සම්බන්ධීකරණ නිලධාරීන් විසින් මෙම වැඩසටහන සංවිධානය කර මෙහෙයවිය යුතු වේ. ඒ අනුව සෑම දිස්ත්‍රික්කයකින් ම එක් පාසලක් කේන්ද්‍රීය මධ්‍යස්ථානය ලෙස තෝරා ගෙන එම මධ්‍යස්ථානය වෙත වගකීම් කාලය අවසන් හා නඩත්තු කළ යුතු පරිගණක හා උපාංග රැගෙන ඒම සඳහා පාසල්වලට කල් වේලා ඇති ව උපදෙස් ලබා දිය යුතු වේ.
3. මෙම උපකරණ රැගෙන ඒමේ දී අදාළ පරිගණක විද්‍යාගාරය භාර ගුරුභවතා හෝ විෂයය භාර ගුරුභවතා හෝ මෙයට සහභාගි විය යුතු අතර එක් එක් පාසලින් රැගෙන යනු ලබන උපකරණ පිළිබඳ ලේඛනයක් පිටපත් 02 කින් යුතුව සකස් කර එක් පිටපතක් පාසලේ විදුහල්පති වෙත ද අනෙක් පිටපත උපකරණ සමඟ අදාළ මධ්‍යස්ථානය වෙත ද රැගෙන ආ යුතු වේ. මෙහි දී ඒ ඒ උපකරණ හඳුනා ගැනීමට හැකිවන සේ ලේඛන ගත කළ යුතු වේ. (අනුක්‍රමික අංකය/ මාදිලි අංකය / මාදිලිය යනාදී වශයෙන්)
4. නඩත්තු කළ යුතු පරිගණක හා උපාංග සංඛ්‍යාව මත පදනම් ව දිස්ත්‍රික් මට්ටමින් වැඩමුළු පවත්වන දින ගණන තීරණය කළ යුතු වන අතර, උපරිම දින ගණන 04 කි. ඒ අනුව ඒ ඒ පළාතේ වැඩසටහන් ප්‍රමාණය එකක් අවසන් වූ පසු එකක් ලෙස සැලසුම් කළ යුතු අතර, මේ සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ශාඛාව සමඟ සාකච්ඡා කර අවසන් තීරණයකට එළඹිය යුතු වේ.
5. අදාළ නඩත්තුව සඳහා අවශ්‍ය වන උපකරණ මිලදී ගැනීම ඒ ඒ පාසල මඟින් සිදු කළ යුතු වන අතර, මේ සඳහා ගුණාත්මක යෙදවුම් චක්‍රලේඛයේ අවශ්‍ය ප්‍රතිපාදන සපයා ඇත. පාසලේ ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවූ විටෙක ඒ සම්බන්ධයෙන් අදාළ කලාප කාර්යාලය හෝ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව ප්‍රතිපාදන ලබා දීමට කටයුතු කළ යුතුවේ. මෙම කටයුතු සම්බන්ධීකරණය කිරීම පළාත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සම්බන්ධීකරණ නිලධාරියාගේ වගකීම වේ.
6. මෙම වැඩසටහන සඳහා සහභාගීකරගනු ලබන දෘඩාංග හා ජාලගත විසඳුම් කණ්ඩායමේ සම්පත් පුද්ගලයින් වෙනුවෙන් අනුමත දීමනා ලබා දීම ද, ඒ ඒ පළාත් මඟින් සිදු කළ යුතු වේ.

අධ්‍යාපන අමාත්‍යාංශයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ශාඛාව මඟින් මෙම සමස්ත වැඩසටහන සම්බන්ධීකරණය කරනු ලබන අතර, එහිදී එක් එක් දිස්ත්‍රික්කයන්හි නඩත්තු වැඩසටහන සඳහා ජාතික මට්ටමේ පුහුණු සංචිතයේ සිටින මෙම කාර්යයේ විශේෂඥ ගුරුභවතුන් කිහිපදෙනකුගේ සහාය සංකීර්ණ ගැටලු විසඳීම සඳහා ඒ ඒ දිස්ත්‍රික් වැඩසටහන් සඳහා ලබා දෙනු ලබන අතර, මෙම සමස්ත වැඩසටහන සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ශාඛාවේ නිලධාරියකු ද සම්බන්ධ කෙරේ. ඒ ඒ දිස්ත්‍රික්කයන්හි සිදු වන නඩත්තු වැඩසටහනේ දී ඒ ඒ උපකරණ සම්බන්ධයෙන් නිර්දේශයන්, සඳහන් කර

ඇති ආකෘති පත්‍රයේ පරිදි සකස් කර ලබා දිය යුතු අතර, එම උපකරණ සඳහා අදාළ නිර්දේශයන් නිල වශයෙන් සිදු කරනු ලබන නිර්දේශ බවට සැලකිය යුතුවේ. එම නිර්දේශයන් අනුව කටයුතු කිරීම විදුහල්පතිවරයාගේ වගකීමක් වන බව ද වැඩිදුරටත් අවධාරණය කරමි.

පාසල් පද්ධතියේ පවතින තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මෙවලම් හි නඩත්තු කටයුතු අධ්‍යාපන පද්ධතිය තුළ ඇති සම්පත් භාවිත කරමින් රජයට අවම වියදමක් වන සේ ක්‍රියාත්මක කරනු ලබන මෙම වැඩපිළිවෙළට ඔබගේ සහයෝගය අත්‍යවශ්‍ය බව ද වැඩිදුරටත් දන්වනු කැමැත්තෙමි.

සුනිල් එස්. සිරිසේන

ලේකම්

අධ්‍යාපන අමාත්‍යාංශය

පිටපත් -

1. සියලු ම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්
2. සියලු ම පළාත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සම්බන්ධීකරණ නිලධාරීන්
3. සියලු ම පළාත් සහ කලාප ගණකාධිකාරීවරුන්

**පරිගණක යන්ත්‍ර අලුත්වැඩියා කිරීමේ තත්ත්ව වාර්තාව**
**(එක් උපකරණයක් සඳහා එක් පෝරමයක් පිරවිය යුතුය.)**

| | | | |
|---|---|---|---|
| 1 | පාසලේ නම ලිපිනය හා දුරකථන අංකය | | |
| 2 | පරිගණක හා සම්බන්ධව අලුත්වැඩියා කිරීමට ඇත්තේ [ √ ] | 1. System Unit | |
| | | 2. Mother Board | |
| | | 3. Monitor | |
| | | 4. වෙනත් (සඳහන් කරන්න) | |
| 3 | පරිගණක වර්ගය හා අනුක්‍රමික අංකය | | |
| 4 | මොනිටරයේ වර්ගය(Model) හා අනුක්‍රමික අංකය | | |
| 5 | මවු පුවරු වර්ගය හා අනුක්‍රමික අංකය | | |
| 6 | වෙනත් (සඳහන් කරන්න) | | |
| 7 | අනාවරණය කරගත් දෝෂ | | |
| | a. | | |
| | b. | | |
| | c. | | |
| 8 | අවශ්‍ය අමතර කොටස් | | |
| | **නම** | **වර්ගය** | **විස්තරය** |
| | a. | | |
| | b. | | |
| | c. | | |
| | d. | | |

9. අවසන් වාර්තාව (පහත සඳහන් 1,2,3 න් අනවශ්‍ය කොටස් කපා හරින්න)

1. මෙම උපකරණය සම්පූර්ණ වශයෙන් යථා තත්වයට පත් කර ඇත.
2. මෙම උපකරණය පහත සඳහන් උපාංග/ය මිලදී ගෙන සවිකිරීමෙන් යථාතත්ත්වයට පත් කර ගත හැකිය.

| | **මිලදී ගතයුතු භාණ්ඩයේ නම** | **අදාළ පිරිවිතර** |
|---|---|---|
| A | | |
| B | | |
| C | | |

3. මෙම උපකරණය භාවිත කළ නොහැක.

උපකරණ පරීක්ෂාකර බැලුවේ

| | **නම** | **රාජකාරී ලිපිනය** | **අත්සන** |
|---|---|---|---|
| A | | | |
| B | | | |
| C | | | |

ඉහත තොරතුරු සත්‍ය හා නිවැරදි වන අතර මෙම පරිගණකය / උපාංගය යථාතත්ත්වයට පත්කර ඇති බව / අලුත්වැඩියා කිරීමට අවශ්‍ය උපාංග / මිල දී ගත යුතු / නොමැති බැවින් භාවිතයෙන් ඉවත්කළ යුතු / බවට නිර්දේශ කරමි. / ප්‍රකාශ කරමි.

නියෝජ්‍ය/සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ)
අධ්‍යාපන අමාත්‍යාංශය / පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව